(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 109.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 ඔක්තෝබර් මස 25 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු  මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු  අ. අරවින්ද් කුමාර් මහතා

ගරු  ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු  ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු  කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු  චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු  උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු  නිහාල් ගලප්පත්ති මහතා

ගරු  දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු  බන්දුල ගුණවර්ධන මහතා

ගරු  එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු  පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු  එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු  ඩී. වී. චානක මහතා

ගරු  සිසිර ජයකොඩි මහතා

ගරු  මලිත් ජයතිලක මහතා

ගරු  (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු  අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු  (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු  ලකී ජයවර්ධන මහතා

ගරු  ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු  මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු  ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු  ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු  එම්. එස්. තෞෆික් මහතා

ගරු  සිරිනාල් ද මෙල් මහතා

ගරු  පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු  මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු  අනුර දිසානායක මහතා

ගරු  මයන්ත දිසානායක මහතා

ගරු  විමලවීර දිසානායක මහතා

ගරු  වීරකුමාර දිසානායක මහතා

ගරු  ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

**ගරු විදුර වික්‍රමනායක මහතා**

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**

**ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා**

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු කංචන විජේසේකර මහතා**

**ගරු හේෂාන් විතානගේ මහතා**

**ගරු එස්. වියාළේන්දිරන් මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

නීල් ඉද්දවල මහතා, වැඩ බලන පාර්ලිමේන්තු මහලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** නියෝජ්‍ය කථානායකතුමා විසින් මතු පළවන නිවේදනය කරන ලදී ,—

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කරන ලද **'එකතු කළ අගය මත බදු (සංශෝධන)'** නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ගරු කථානායකතුමා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

එකී පනත් කෙටුම්පත හෝ එහි විධිවිධාන කිසිවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) නියෝජ්‍ය කථානායකතුමා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, 2013 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XX කොටස සහ හතරවැනි කාණ්ඩයේ XI කොටස, 2014 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XIV, XV සහ XVI කොටස්, තුන්වැනි කාණ්ඩයේ IV වැනි කොටස සහ හතරවැනි කාණ්ඩයේ VIII, IX සහ X කොටස් පිළිගන්වන ලදී.

එම වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි ද මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

(2) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම් පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, සුරාබදු ආඥාපනතේ (52 වැනි අධිකාරය වන), 32 වගන්තිය සමඟ කියවනු ලබන 22 වගන්තිය යටතේ විදේශීය මත්පැන් මත සුරාබදු පැනවීම සහ විදේශීය මත්පැන් ආනයනය කිරීමට අදාළ රීති පැනවීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2016 අගෝස්තු 26 දිනැති අංක 1981/87 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා, එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2013 සහ 2014 වර්ෂ සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තා කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්—

(i) 2012 වර්ෂය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2013 වර්ෂය සඳහා ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා සෞඛ්‍යය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 අගෝස්තු 23 දිනැති අංක 1981/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය පිළිගන්වා, එම නියෝගය රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවට සහ ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. පෙත්සම් :**

(1) (i) හෝමාගම, මාගම්මන, අංක 154/2 දරන ස්ථානයෙහි පදිංචි ඒ. ඒ. ඩී. පී. අමරතුංග මහතාගෙන් ලැබුණු 2016.06.21 දිනැති පෙත්සම; සහ

(ii) රනාල, නවගමුව, අංක 01 දරන ස්ථානයෙහි පදිංචි පී. ජී. විමලාවතී මහත්මියගෙන් ලැබුණු 2016.06.18 දිනැති පෙත්සම

ගරු සුජීව සේනසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) රාගම, නැලිගම, අංක 361 දරන ස්ථානයෙහි පදිංචි ඩී. රෝහිණී ස්වර්ණමාලි මහත්මියගෙන් ලැබුණු 2016.09.26 දිනැති පෙත්සම ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) කුරුණෑගල, ජයන්තිපුර, අංක E - 92 - B දරන ස්ථානයෙහි පදිංචි අයි. එස්. ගලපිටගෙදර මහත්මියගෙන් ලැබුණු 2016.08.15 දිනැති පෙත්සම;

(ii) යටිගල්ඔලුව, කැත්තකෙටුහේන, අංක 52 දරන ස්ථානයෙහි පදිංචි පී. එල්. හේමසිරි විජේවර්ධන මහතාගෙන් ලැබුණු 2016.08.26 දිනැති පෙත්සම; සහ

(iii) පොල්ගහවෙල, වැල්ලැව, පන්සල පාර යන ලිපිනයෙහි පදිංචි එස්. එම්. විනීතා සේනාධිපති මහත්මියගෙන් ලැබුණු 2016.09.30 දිනැති පෙත්සම

ගරු අශෝක් අබේසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

(4) ඇහැලියගොඩ, බුළුගහපිටිය, අංක 326 බී 02 දරන ස්ථානයෙහි පදිංචි එච්. ඒ. එස්. ෆොන්සේකා මහතාගෙන් ලැබුණු 2015.11.23 දිනැති පෙත්සම ගරු කරුණාරත්න පරණවිතාන මහතා විසින් පිළිගන්වන ලදී.

(5) පන්නිපිටිය, හිරිපිටිය, අංක 63/6 දරන ස්ථානයෙහි පදිංචි සී. ආර්. යටිගම්මන මහතාගෙන් ලැබුණු 2016.01.25 දිනැති පෙත්සම ගරු බන්දුල ගුණවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(6) කැස්බෑව, මාවිත්තර, හොරණ පාර, අංක 6/10 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඩී. දයානන්ද මහතාගෙන් ලැබුණු 2016.09.05 දිනැති පෙත්සම ගරු සිරිනාල් ද මෙල් මහතා විසින් පිළිගන්වන ලදී.

(7) මැදිරිගිරිය, මහ අඹගස්වැව, යාය II, අංක 94 දරන ස්ථානයෙහි පදිංචි පී. වී. පත්මලතා මහත්මියගෙන් ලැබුණු 2016.08.14 දිනැති පෙත්සම ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා විසින් පිළිගන්වන ලදී.

(8) (i) බටපොල, මහවත්ත, අංක 12 දරන ස්ථානයෙහි පදිංචි එච්. එම්. කරුණාතුංග මහතාගෙන් ලැබුණු 2016.08.03 දිනැති පෙත්සම;

(ii) කොළඹ 05, කිරුළ පාර, අංක 505 දරන ස්ථානයෙහි සේවයේ නියුතු එම්. එච්. කේ. උදයරත්න මහතාගෙන් ලැබුණු 2016.09.02 දිනැති පෙත්සම; සහ

(iii) කොළඹ 05, කිරුළ පාර, අංක 505 දරන ස්ථානයෙහි සේවයේ නියුතු එම්. එච්. කේ. උදයරත්න මහතාගෙන් ලැබුණු 2016.09.02 දිනැති පෙත්සම

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා විසින් පිළිගන්වන ලදී.

(9) ලංකා බැංකුවේ, ගල්නෑව ශාඛාවේ සේවය කරන ඩබ්ලිව්. එම්. වීරසේකර මහතාගෙන් ලැබුණු 2016.08.25 දිනැති පෙත්සම ගරු ඉෂාක් රහුමාන් මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) :** මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2016 නොවැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**5. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා, ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සරවනපවන් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**6. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු ශෙහාන් සේමසිංහ මහතා, ගරු නාමල් රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මහිපාල හේරත් ජන සහන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**7. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු මලිත් ජයතිලක මහතා, ගරු අංගජන් රාමනාදන් මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මෛත්‍රීපාල සිරිසේන ලක්දරු දිරිය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**8. තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව:—** ගරු බුද්ධික පතිරණ මහතා, ලකී ජයවර්ධන මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් එහි අංක A/RES/70/1 දරන යෝජනා සම්මතය මඟින් අපේක්ෂා සහගත තිරසර සංවර්ධන අරමුණු (SDGs) දහ හතක් ඇතුළත් තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය දියත් කර ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි ආණ්ඩුව ද මෙම යෝජනා සම්මතය අනුමත කර එකී න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා නිති උනන්දුවෙන් යුතුව කටයුතු කිරීමට කැපවී සිටින හෙයින් ද;

තිරසර සංවර්ධන අරමුණු, තිරසර සංවර්ධනයෙහි ආර්ථික, සමාජයීය සහ පාරිසරික මානයන් සංයෝජනය කෙරෙන අන්තර් බැඳීම් සහිත රාමුවකින් යුක්ත වන හෙයින් ද;

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී පාර්ලිමේන්තු ඒවායෙහි නීති සම්පාදන, අයවැය සකස්කිරීමේ සහ අධීක්ෂණ කාර්යයන් හරහා ප්‍රමුඛස්ථානය ගෙන සිටින හෙයින් ද;

තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ කාර්යය ඉෂ්ට කෙරෙන බව සහතික කර ගැනීම සඳහා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කර සිටියි:—

(අ) අදාළ රේඛීය අමාත්‍යාංශ විමසා ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ නීති සම්පාදනය;

(ආ) ප්‍රමාණවත් පරිදි දේශීය සම්පත් වෙන් කර දීම සහ ජාත්‍යන්තර අරමුදල් සපයාගැනීමේ ක්‍රම සොයාගැනීම;

(ඇ) ක්‍රියාත්මක කිරීමේ රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය;

(ඈ) ජාතික, පළාත් සභා සහ පළාත් පාලන මට්ටම්වලදී ජාලගතකරණ ක්‍රියාමාර්ග;

(ඉ) රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය දිරිමත් කිරීම;

(ඊ) එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනවල සහ සිවිල් සමාජ සංවිධානවල සහාය ලබා ගැනීම;

(උ) කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමෙන් රටවල් අතර ප්‍රවීණතාවය සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම;

(ඌ) වෙනම දත්ත පදනමක් සකස් කිරීම සහ කාලීන වශයෙන් ප්‍රගතිය සමාලෝචනය කිරීම; සහ

(එ) ඉහත සඳහන් කරුණු හා සම්බන්ධ හෝ එම කරුණුවලට ආනුෂංගික සියලු කාරණා පිළිබඳ සළකා බැලීම.

2. (අ) එකී කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකවරයා විසින් පත්කළ යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් පහළොස් දෙනෙකුට (15) නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. එකී කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කර ඇති කරුණු පූර්ණ වශයෙන් සලකා බැලීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම පුද්ගලයෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා දීමට හෝ ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවට සහාය වීම පිණිස අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඇ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමු රැස්වීම් දිනයේ සිට එක් වසරක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් ලබාදෙන අන් කවර හෝ අමතර කාලසීමාවක් තුළ හෝ කාරක සභාව විසින් සිය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. [පා. 187/'16]

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. කල් තැබීම (අගෝස්තු 09 වැනි දින ඉදිරිපත් කළ 'කෝප්' වාර්තාව විධායකයේ අවධානයට ලක් කිරීම) :** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය''යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

''ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය''යි අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.25 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

''ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය''යි ක්‍රීඩා අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.10 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා. 5.50 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2016 ඔක්තෝබර් 07 දින සභා සම්මතිය අනුව, 2016 ඔක්තෝබර් මස 26 වැනි බදාදා පූ. භා. 10.30 වනතෙක් කල් ගියේය.